දිවයින

# දේශපාලනයේ මෙතෙක් කතාව

2007 නොවැම්බර් මස 12 වැනිද සඳුද



දේශපාලනයේ මෙතෙක් කතාව ඔබේය. එය ඔබේ යැයි කියන්නේ මිනිසා දේශපාලන සත්ත්වයකු වූ නිසාම නොවේ. වත්මන් දේශපාලනයෙහි හැසිරීම අවබෝධ කරගන්නට තරම් දේ ඉතිහාසයෙන් ලැබෙන නිසාය. ඒ නිසාම දේශපාලනයේ ඔබ සතු රස තොරතුරු, ඡායාරූප අපට එවා ඒ ඉතිහාසයේ රඟ අනෙකුත් අය සමඟ බෙද හද ගන්න.


දේශපාලනයේ මෙතෙක් කතාව දිවයින
අංක 223
බිලුමැන්ඩල් පාර - කොළඹ 13
විද්‍යුත් ලිපිනය
manojabaya@yahoo.com

සංස්කරණය - මනෝජ් අබයදීර


එල්.එච්. මෙත්තානන්ද මහතා දැයෙන් සමුගෙන පසු ගිය නොවැම්බර් 01 වන දට වසර 40 ක් සම්පූර්ණ විය. කොළඹ ආනන්ද මහා විද්‍යාලය, නාලන්ද මහා විද්‍යාලය, මහනුවර ධර්මරාජ විද්‍යාලය යන ප්‍රධාන විද්‍යාල වල විදුහල්පතිවරයා ලෙසත් ඉන් අනතුරුව ඩොමිනියන් තත්ත්වයේ පසුව මෙරටට අංග සම්පූර්ණ නිදහස ලබාදීම සඳහාත් ඒ මහතා සිය කාලය සහ ධනය වැය කොට ඇත. ස්වභාෂා අධ්‍යාපනය නගා සිටුවීම, සිංහල පමණක් රාජ්‍ය භාෂාව කිරීම, පෙඩරල්වාදය පරාජය කිරීම යන කාරණා වෙනුවෙන් කැප වී කටයුතු කොට ඇති ඒ මහතා පිළිබඳව විවිධ පුද්ගලයන් විවිධ දේ ප්‍රකාශ කොට ඇත. නමුත් තවදුරටත් බොහෝ කරුණු , කාලයේ වැලි තලාවෙන් වැසී ගොස් ඇති බැවින් එම කරුණු පිළිබඳව විමසීමට අපි අදහස් කළෙමු. ඒ සඳහා අප මෙත්තානන්ද මහතා ආනන්දයේ විදුහල්පති ලෙස කටයුතු කළ සමයේ එහි අධ්‍යාපනය ලද සිසුන් වූ හිටපු හමුදපති හැමිල්ටන් වනසිංහ, ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න, මහාචාර්ය පී.ඒ. ද සිල්වා යන මහතුන්ගෙන් සහ මෙත්තානන්ද මහතා පිළිබඳව විවිධ අත් දැකීම් ඇති හිටපු මුදල් ඇමැතිවරයකු- වන රොනීද මැල් සහ ප්‍රකට දේශකයකු වන ජේ.ආර්.පී සූරියප්පෙරුම මහතාගෙන් විමසීමට අප කටයුතු කළෙමු. ඔවුන් මෙත්තානන්ද මහතා පිළිබඳව සිය මතකයන් අවධි කළේ මෙසේය. ඔවුන් අප හා ප්‍රකාශ කළ කරුණු අනුව මෙත්තානන්ද මහතා පිළිබඳව බොහෝ තොරතුරු කාලයේ වැලිතලාවට වැසී ඇත යන අපගේ නිගමනය ද නිවැරදි බව තහවුරු විය.



## අපේ ලේවලට රට ජාතිය පිළිබඳ හැඟීම ඇතුළු කළා

හිටපු යුද හමුදපති
**හැමිල්ටන් වනසිංහ**

දෙවන ලෝක යුද්ධය පැවති කාලයේදී කොළඹ ආනන්දයේ ශාඛාවක් ගම්පහ ප්‍රදේශයේ පිහිටුවා තිබුණා. එම ශාඛාව 1946 දී කොළඹට රැගෙන ආවා. මම කොළඹ ආනන්දයට සම්බන්ධ වූයෙත් එම අවස්ථාවේදියි. එම කාලයේදී කොළඹ ආනන්දයේ විදුහල්පති ලෙස ඒ. බී. පෙරේරා මහතා කටයුතු කළා. ඒ. බී. පෙරේරා මහතාගෙන් පසුව එල්. එච්. මෙත්තානන්ද මහතා ආනන්දයේ විදුහල්පති ලෙස පත්වී ආවා.

එම කාලයේදී රට තුළ නොයෙකුත් අදෘෂ්‍යමාන බලවේග බෞද්ධයන්ට එරෙහිව ක්‍රියාත්මක වූවා. මෙත්තානන්ද මහතා ශිෂ්‍යයන් වූ අපව ඒ පිළිබඳව දැනුවත් කළා. උද්යෝගිමත් කළා.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව රයිෆල් වෙඩි තැබීමේ තරගයක් හුණුපිටියේ වෙඩි භූමියේදී පළමු වතාවට පැවැත්වූ වූවා. ආරම්භ කිරීමේ පළමු වෙඩිල්ල තැබුවේ ඩී. එස්. සේනානායක මහතා විසිනුයි. ආනන්ද විද්‍යාලයෙනුත් කණ්ඩායමක් ඊට සහභාගි වූවා. අපි වෙඩි තබනවා බලන්න ආ මෙත්තානන්ද මහතා අපව ඒ සඳහා උනන්දු කළා. පසුව ආනන්දයේ ශිෂ්‍ය භට කණ්ඩායම දියතලාවේ පැවති වෙඩි තැබීමේ තරගයකදී බ්‍රිතාන්‍ය හමුද කණ්ඩායමකුත් පරාජයට පත් කළා. ඒ වගේම ආනන්දයේ ශිෂ්‍ය භට කණ්ඩායම සී. සොයිසා අභියෝගතා ශූරතාවත් දිනා ගත්තා. 1948 දී පමණ සහිරා විද්‍යාලය සමග පැවැති වෙඩි තැබීමේ තරගයකින් මගේ ප්ලැටූන් එක ජයග්‍රහණය කළා. එදිනම පැවති බොක්සින් තරගයකින් එච්. පී. ජයසූරිය ජයග්‍රහණය කළා. මෙම ජයග්‍රහණ දෙක ආනන්ද විද්‍යාලයේ අපි ප්‍රබෝධමත් කළා.

1949 දී අපි හර්මන්ලූසි කුසලානය දිනා ගත්තා. ඊට පසුවත් අපි කුසලාන කිහිපයක් ජයග්‍රහණය කළා.


මෙත්තානන්ද මහතා විදුහල්පතිවරයා ලෙස කටයුතු කරද්දී පාසල ආරම්භ කිරීමට පෙර

රැස්වීම් පවත්වනවා. එක් දිනක් ප්‍රමාදවී පාසල් පැමිණෙන සිසුන් පිළිබඳව සඳහන් කරමින් "බස් එක අපි එනකම් ඉන්නේ නැහැ. බස් එක එන විට අප සූදානම්වී සිටිය යුතු බව" ප්‍රකාශ කළා.

ඒ වගේම ඉන්දියාවේ මහත්මා ගාන්ධිතුමාට වෙඩි තැබූ දිනට පසු දින උදයෙත් සිසුන් සඳහා රැස්වීම පැවැත්වූවා. එහිදී ඒ පිළිබඳව සඳහන් කළ එතුමා "ෂොට්, ෂොට්, ෂොට්" යනුවෙන් සඳහන් කළ එතුමා සාක්කුවෙන් ලේන්සුව ගෙන කඳුළු පිසද ගත්තා.

තවත් දිනකදී බුරුමයේ ඇටර්නි ජනරල්තුමා වූ යූ චාන් ටූං මහතා එයාගේ පුතාත්, තවත් ඥාතියකුත් රැගෙන ඇවිත් මගේ ගුරුට බාර දෙනවා කියා මෙත්තානන්ද මහතාට බාර දුන්නා. එල්. එච්. මෙත්තානන්ද මහතා ආනන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා ලෙස කටයුතු කළ සමයේදී කැඩෙට් කණ්ඩායම දියුණු කිරීමට සහ වෙඩි තැබීම දියුණු කිරීමට විශේෂ උනන්දුවකින් කටයුතු කළා. එද එම කටයුතු ආනන්දයේ අනන්‍යතාව හඳුනා ගැනීමේ සලකුණු වූවා. ආනන්දයේ කැඩෙට් කණ්ඩායමේ සිට යුද හමුදවට එක්වූ කිහිපදෙනකුම හමුදපති ධූරයට පත්වී තිබෙනවා. මගෙන් පසුව, රොහාන් දළුවත්ත, ලයනල් බලගල්ල, සරත් ෆොන්සේකා යන මහත්වරුන් හමුදපති ධූරය සඳහා පත්වී තිබෙනවා. වත්මන් ආරක්ෂක ලේකම්වරයාත් ආදි ආනන්දියෙක් වනවා.

එල්. එච්. මෙත්තානන්ද මහතා අපගේ ලේ වලට රට, ජාතිය, ආගම පිළිබඳව හැඟීම ඇතුළත් කළා. එතුමා විශේෂයෙන්ම සිංහල - බෞද්ධ ජනතාවට තිබුණ ප්‍රශ්න පිළිබඳව නිර්භයව කතා කළා. ඒ වගේම රජයත් දැනුවත් කළා.



## බෞද්ධයන්ට එඩිතර නායකත්වයක් ලබාදුන්නා

මුදල් හා ආර්ථික කටයුතු පිළිබඳ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක, බෞද්ධ ජාතික බලවේගයේ හිටපු උප සභාපති
**රොනී ද මැල්**

එල්. එච්. මෙත්තානන්ද මහතා පසුගිය සියවස තුළදී මේ රටේ ඉපදුන ශ්‍රේෂ්ඨ බෞද්ධ නායකයකු ලෙස හඳුන්වාදීමට පුළුවන්. මූලික වශයෙන් එතුමා මෙරට ප්‍රධාන බෞද්ධ පාසල් කිහිපයකම විදුහල්පතිවරයා ලෙස කටයුතු කළා.

මහනුවර ධර්මරාජ විද්‍යාලය විශාල වශයෙන් දියුණු කොට මෙරට බෞද්ධ පාසලක් බවට පත් කළා. ඊට පසුව කොළඹ ආනන්ද විද්‍යාලයේ විදුහල්පති ලෙස පත්වූවා. ජී. ද එස්. කුලරත්න මහතා කොළඹ ආනන්ද විද්‍යාලයේ විදුහල්පති ලෙස කටයුතු කළ කාල සීමාවට පසුව මෙත්තානන්ද මහතාගේ කාලයේදී ආනන්ද විද්‍යාලය විශාල දියුණුවක් ලැබුවා.

ඊට පසුව රටේ අස්සක් මුල්ලක් නැර අතිවිශාල


රැස්වීම් ප්‍රමාණයක් පවත්වා බෞද්ධයන්, සිංහලයන් ප්‍රමෝධමත් කළා. එම ප්‍රබෝධයේ ප්‍රතිඵලයක් ලෙස 1956 දී එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමාට සහ මහජන එක්සත් පෙරමුණට රටේ දේශපාලන බලය ලබා ගැනීමට පුළුවන් වූවා. 1956 දී සිදුවූ විප්ලවය සඳහා මූලිකත්වය ගත් නායකයකු ලෙස මට මෙත්තානන්ද මහතා හඳුන්වාදීමට පුළුවන්.

ඊට පසුව බෞද්ධ ජාතික බලවේගය ඇති කොට බෞද්ධයන්ට එඩිතර නායකත්වයක් ලබාදෙමින් ජීවිතයම ඒ සඳහා කැප කළා. බෞද්ධ ජාතික බලවේගයේ උප සභාපතිවරයකු ලෙස කටයුතු කරමින් මටත් එතුමාට අතහිත දෙන්න වාසනාව ලැබුණා.



දේශපාලන යුග මෙහෙවරක යෙදුනු ප්‍රාඥයා

# මෙත්තානන්ද



## මමත් ඔහු අනුව යමින් ජාතික ඇඳුම ඇන්ද

නව වාමාංශික පෙරමුණේ නායක
ආචාර්ය-**වික්‍රමබාහු කරුණාරත්න**

මම ආනන්දයට 1953 වසරේදී ඇතුළත් වූවා. ඒ අවස්ථාව වන විට ආනන්දයේ විදුහල්පති ලෙස එල්. එච්. මෙත්තානන්ද මහතා කටයුතු කළා. ඒ කාලෙයේදී පාසල තුළ සිංහල ජාතික, බෞද්ධ ප්‍රබෝධයක් තිබුණා. එම ප්‍රබෝධයේ නායකයා වූයේ මෙත්තානන්ද මහතායි. ආරිය සිංහල ඇඳුම ඇඳපු මෙත්තානන්ද මහතා එය ප්‍රචලිත කිරීමටත් කටයුතු කළා. මමත් සුදු කොට කලිසම ගලවා පැත්තකින් තබා ටික කාලයක් ආරිය සිංහල ඇඳුමත් ඇඳගෙන පාසල් ගියා. ඒ වන විට මට වයස අවු. 10 ක් පමණ ඇති. ඒ සඳහා මම දෙමව්පියන් කැමති කරවා ගත්තා.

ආනන්දයේ බෞද්ධ ප්‍රබෝධය සඳහා බටහිර බලපෑම නිසා බටහිර සංස්කෘතික බලපෑම නිසා සිංහලකම යටපත්වීම වළක්වා ගැනීම යන මතය ඉදිරිපත්වී තිබෙන බව පෙනෙනවා. ඒ වගේම ක්‍රිස්තියානි පාසල් දෙස බැලුවෙත් තරගකාරි ලෙසයි. එහි වැරදි පැත්තකුත් තිබුණා. සෙන් ජෝසප් විද්‍යාලය ඉදිරිපිට වටරවුමේ ලෙගොන් පියතුමාගේ පිළිරුවක් පිහිටුවීමට කටයුතු සූදානම් කොට තිබුණා. ලෙගොන් පියතුමා ගුරුවරයකු ලෙස සලකා එම පිළිරුව පිහිටුවීමට පියවර ගෙන තිබුණා. නමුත් එම අවස්ථාවේදී එය වැළැක්වීම සඳහා එම ස්ථානයේ බුද්ධ ප්‍රතිමාවක් තබා තිබෙනවා. එම ක්‍රියාව ලොකු දෙයක් ලෙස එද ආනන්දයේ කතා වූවා. මේ දක්වාත් එම ප්‍රතිමාව තැබීමට නොහැකිවී තිබෙනවා.



## ඒ කාලයේ ඔහු මුණ ගැසෙන්නට බණ්ඩාරනායක ආනන්දයට එනවා

මහාචාර්ය-**පී. ඒ. ද සිල්වා**

ආනන්දයේ පැවැති පරිසරය නිසා සිංහල භාෂාව, සාහිත්‍ය කෙරෙහි මගේ සිත ඇදී ගියා. ගුරුවරුන් ඒ සඳහා විශාල උනන්දුවක් ඇති කළා. විද්‍යා විෂයයන් හැදෑරීම නිසා එම විෂයයන් පිළිබඳව වැඩිදුරටත් ඉගෙන ගැනීමට නොහැකි වූවත්, අදත් මට සාහිත්‍ය සම්බන්ධ කටයුතු වලදී සහ ලියන කියන කටයුතුවලදී එද ලද ආභාෂය විශාල පිටිවහලක් වී තිබෙනවා.

ඒ වගේම අපගේ සිතුම් පැතුම් කෙරෙහිත්, බුද්ධාගම ඇදහීමකට වඩා දර්ශනවාදයක් ලෙස ඉගෙන ගැනීමටත් එම පසුබිම බලපෑවා. මේ සියලු කටයුතු සඳහා මෙත්තානන්ද මහතාගේ බලපෑම තිබුණා.

පාසල තුළ දෙමළ විරෝධයක් තිබුණේ නැහැ. දෙමළ භාෂාව ඉගෙන ගැනීමටත් උනන්දු කළා. පාසල තුළ තනබාලසිංහම් (කරාලසිංහම්ගේ සහෝදරයා) වගේ අය සිටියා. අප ඔවුන් සමගත් කටයුතු කළා.

මම ආනන්දයේදී ශිෂ්‍ය භට කණ්ඩායමේත් කටයුතු කළා. අපව යටපත් කිරීමට කටයුතු කරනවා. එම නිසා දිනන්න ඕනි යන ආකල්පය අප තුළ ඇති කළා. අප 1958 දී හර්මන්ලූස් කුසලානයත් දිනා ගත්තා. ඒ වගේම චෙස් ක්‍රීඩාව සඳහා වූ මිලස් කුසලානයත් දිනා ගත්තා. ඒ සෑම කටයුත්තක් සඳහාම අපව උනන්දු කළේ මෙත්තානන්ද මහතායි.

ආනන්දයේ මෙත්තානන්ද කිව්වත් මෙත්තානන්දගේ ආනන්දය කිව්වත් කිසිවකුට දෙසක් කීමට පුළුවන් කියා මම හිතන්නේ නැහැ. මන්ද ආනන්දයේ ස්වර්ණමය යුගය එයමැයි යන්න කවුරුත් පිළිගන්නා සත්‍යයක්.


මා හට කොළඹ ආනන්ද විද්‍යාලයට යෑමට සිදුවූයේ, පානදුර ශ්‍රී සුමංගල විද්‍යාලයේ ඉංජිනේරු විද්‍යාවට අදාළ විෂයන් නොතිබුණ නිසයි. එද ආනන්දයේ උසස් පෙළ පංතියට ඇතුළත්වීම සඳහා තරග විභාගයක් පැවැත්වූවා. එම විභාගයෙන් සමත්ව මා ආනන්දයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලබා ඇති බව

එල්. එච්. මෙත්තානන්ද මහතා නමින් එවූ ලිපියකින් දන්වූවා.

මම ආනන්දයට ඇතුළත් වූයේ 1952 කේ ජනවාරි මාසයේ මුලදීයි. අප රටෙහි ස්වභාෂාව දියුණු කර ගැනීමේ අවශ්‍යතාව එතුමා අපට නිතර පෙන්වා දුන්නා. එද ස්වභාෂා සටනක් ඇරඹී තිබුණා. එතුමා අපට ඕනෑ තරම් භාෂා ඉගෙන ගන්න නමුත් තම මව් බසට මුල් තැන දෙන්න යනුවෙන් ප්‍රකාශ කළා. අනාගතයේදී බොහෝ තාක්ෂණ පොත් රුසියන් බසින් පලවන බවත්, එම නිසා රුසියන් භාෂාව ඉගෙන ගන්න ලෙසත් එතුමා ප්‍රකාශ කළා. නමුත් එතුමා මාක්ස්වාදියකුවත්, රුසියාවට ගැති පුද්ගලයකුවත් වූයේ නැහැ. එතුමා එම ප්‍රකාශය කළේ අපේ රට රුසියාව සමග තානාපති සම්බන්ධකම් පවා ඇති කර ගෙන නොතිබුණු යුගයක බව අප මතක තබා ගත යුතුයි.

එවකට තිබුණ එකම විශ්ව විද්‍යාලය වන ලංකා විශ්ව විද්‍යාලයට මම තේරී පත් වූ අවස්ථාවේදී එතුමා විශ්ව විද්‍යාලයට ගිය විට මත් පැනට යොමු නොවන ලෙසත්, ප්‍රේම සම්බන්ධතාවල නොපැටලෙන ලෙසත්, දේශපාලනයෙහි නොපැටලෙන ලෙසත්, නමුත් ස්වභාෂා සටන දිගටම ගෙන යන ලෙසත් අවවාද කළා. එතුමා ඉල්ලා සිටි පරිදිම මම දිගටම ස්වභාෂා සටනේ නිරත වූවා. එහි ප්‍රතිඵලයක් ලෙස මට ස්වභාෂා සිල්වා යනුවෙන් නමකුත් පටබැඳුණා. ඔවුන් එම නම මට පටබැන්දේ මට සමච්චල් කිරීම සඳහා වුවත් මම අදත් ස්වභාෂා සටන ගෙන යනවා. හෙටත් ගෙන යනවා.

මෙත්තානන්ද මහතාගේ ජාතික ආගමික කටයුතු පාසලට සීමා නොවුන බව 1953 පමණ කාලයේදීම අපට අවබෝධ වූවා. එම කාලයේදී සතියේ දිනවල සවස 3.00 ට පමණ එස්.ඩබ්.ආර්.ඩී බණ්ඩාරනායක මහතා ආනන්දයට පැමිණ මෙත්තානන්ද මහතා මුණ ගැසෙනවා. අපත් සමහර දිනවල සවස් වරුවේදී කීර්තිසිංහ මහතාගේ රේඩියෝ ක්ලබ් එකේ කටයුතු වලට සහභාගි වූ නිසා එම කටයුතු දන ගන්න ලැබුණා. බණ්ඩාරනායක මහතා මෙත්තානන්ද මහතාගේ කාමරය තුළ සිටින කිසිදු ළමයකුට ඒ තුළට යෑමට නොහැකි වන ලෙස එම්.ඩබ්. කරුණාරත්න මහතා වේවැලකුත් රැගෙන ඒ අසල රැඳී සිටිනවා. එතුමා තමයි අපට ඒ පිළිබඳව විස්තර කිව්වේ.



## "56 පුරෝගාමියා ඔහුයි

**ජේ. ආර්. පී සූරියප්පෙරුම**

1948 දී නිදහස ලැබූ ලංකාව ස්වෛරී රාජ්‍යයකට අවශ්‍ය යාන්ත්‍රණය නොමැති වීම නිසා මහත් අර්බුදයකට මුහුණ පා සිටියා. එම අවස්ථාවේදී අග්‍රමාත්‍ය

ඩී. එස්. සේනානායක මහතා ලංකාවේ ප්‍රධාන පාඨශාලාවල ආචාර්යවරුන්ගෙන් ඉල්ලීමක් කළා. මෙරට රාජ්‍ය යන්ත්‍රය මෙහෙය වන ලද විදේශීය සුදු නිලධාරීන් ආපසු සියරට බලා යන බවත්, එම අඩුව සම්පූර්ණ කිරීම සඳහා දේශීය නිලධාරීන් අවශ්‍ය වී ඇති බවත් අග්‍රාමාත්‍යවරයා ප්‍රකාශ කළා.

මෙම ඉල්ලීමට සවන් දුන් පාඨශාලා අතරින් අග්‍රගන්‍යයේ පාසල වූයේ ආනන්ද මහ විද්‍යාලයයි.

නිදහස් ලංකාවේ පාලන යන්ත්‍රයේ වගකීම උසුලා ගැනීම සඳහා සිවිල් නිලධාරින්, වෛද්‍යවරුන්, ඉංජිනේරුවන් හා වෙනත් නිලධාරින් ද සමාජ නායකයන් බිහි කිරීමේ වගකීම භාරගෙන ආනන්ද විද්‍යාලය දුවැන්ත ජාතික මෙහෙවරකට සූදනම් වූවා.

1948 වන විට ලංකාවේ අග්‍රවිශ්වයකාරයා ලෙස සර් . ඇලන් පොස් මහතාත්, විශ්ව විද්‍යාලයේ උප කුලපති ලෙස අයිවර් ජෙනින්ග්ස් මහතාත්, යුද්ධ හමුදවේ නායකයා ලෙස කෙනන්ස් සාමිවරයාත් කටයුතු කළා. වෙනත් උසස් නිලතල බොහෝමයක්ම දරන ලද්දේත් බ්‍රිතාන්‍ය සුදු නිලධාරින් විසින්. ඒ සියලු දෙනාම ලහි ලහියේ ලංකාව හැරද මව්රට බලා යෑමට පටන් ගත්හ.

විශේෂයෙන්ම යුද්ධ හමුදව පිහිට වූයේ 1948 වර්ෂයේදීය. ඒ වන විටත් කටුනායක ගුවන් හමුද කඳවුර, සහ ත්‍රිකුණාමලයේ නාවික හමුද කඳවුර බ්‍රිතාන්‍ය පාලනය යටතේ පැවතියා.

මෙම අවස්ථාවේ දී ලංකා දේශ ආරක්ෂක හමුදවක අවශ්‍යතාව දේශපාලන නායකත්වයට අවබෝධ වී තිබුණා. එම ජාතික මෙහෙවර හද පත්ලෙහි දරණය කරගත් උතුම් මහත්මයකු ලෙස එල්.එච්. මෙත්තානන්ද මහතා හඳුන්වාදීමට පුළුවන්. එතුමා පළමුව මහනුවර ධර්මරාජ විද්‍යාලයෙත්, ඉන් පසුව ආනන්ද විද්‍යාලයෙත් විදුහල්පතිධූරය දරූ ගුරු පියෙක්.

ඒ වන විට ප්‍රධාන ප්‍රශ්නයක් පැන නැඟී තිබුණා. එනම් 5 වන ශ්‍රේණියෙන් ඉහළ පංතිවලට විද්‍යාව උගන්වන්නේ කුමන භාෂාවකින් ද යන්න තීරණය කිරීමයි. සෙසු විද්‍යාල මේ පිළිබඳව මැලිකමක් දක්වද්දී මෙත්තානන්ද මැතිතුමා ඓතිහාසික තීන්දුවක් ගත්තා. එම තීන්දුව නම් විද්‍යාව ඉහළ පංති වලට මව්බසින් ඉගැන්විය යුතු නම් එම වගකීම ආනන්දය බාරගන්න බවයි. මෙම තීරණය එවකට විප්ලවීය පියවරක් වූවා. ඒ සමගම විද්‍යා අධ්‍යාපනය සිංහලෙන් ඉගැන්වීම ලංකාව පුරාම ආරම්භ වූවා.

මෙත්තානන්ද මැතිතුමා ලංකාවේ යුද්ධ හමුදවේ අනාගතය පිළිබඳවත් කල්පනා කර තිබුණා. ඒ සඳහා ලංකාවේ බෞද්ධ විද්‍යාලවල ප්‍රගුණ කරන ලද කුඩට්භට හමුදවත් ලංකා යුද්ධ හමුදවට අනියුක්ත කිරීම එතුමාගේ අරමුණ වූවා. ඒ වන විට බෞද්ධ නොවන පාසල් මහ හඬින් කියා සිටියේ අපි හමුදවට නිලධාරින් දෙන්නම්, ආනන්ද නාලන්ද විද්‍යාල වලින් සෙබළුන් දුන්නා වේ යනුවෙන්. මේ ඇතැම් පදයට නිහඬවම පිළිතුරු දීමට මෙත්තානන්ද මහතා තීන්දු කළා. සියලුම බෞද්ධ විද්‍යාලවල කැඩට් ගුරුවරුන් කැඳවා දක්ෂ භට කණ්ඩායම් සකස් කරන ලෙස ඉල්ලා සිටියා.

1948 සිට ගත වූ මුල් වසර 10 ය ලංකාවේ යුද්ධ හමුදවට අත්තිවාරම වැටුණ යුගය. ආනන්ද විද්‍යාලයෙන් විශ්‍රාම ගිය පසුවත් එතුමා වරින් වර විද්‍යාලයට පැමිණියා. පැමිණ විද්‍යාලයේ ඉදිරි ගමන, උසස් පංති වලට අධ්‍යාපනය ලබාදීම, ආදී කරුණු පිළිබඳව අධීක්ෂණය කළා. එය විද්‍යාලයට විශාල සවියක් වූවා.

1950 දශකයේ මැද භාගයේ ආනන්ද විද්‍යාලයේ ඉගැන්වීමට ගිය අවස්ථාවේදී කලාතුරකින් එන මෙත්තානන්ද මහතා එහි දී මට හමුවුණා. මට පැත්තකට කතා කළ එතුමා ගාම්භීර ලෙස "ගොඩ නැගෙමින් පවතින ලංකා යුද්ධ හමුදව ආනන්දයේ - නාලන්දයේ කැඩට්භටයින් විසින් පාලනය කළ යුතු බව" ප්‍රකාශ කළා. එම ප්‍රකාශය අදත් මගේ හදවතේ රැව් පිළිරැව් දෙනවා. එම වගකීමෙන් ලිස්සා ගියොත් ලංකාවට අනාගතයක් නොමැති බවත් එතුමා ප්‍රකාශ කළා. පංතියෙදි හොඳ දක්ෂ සිසුන් මුණ ගැසුණ විට කැඩට් හමුදවේ පුහුණුවීමට යවන ලෙසත් එතුමා ඉල්ලා සිටියා.

**එරික් ගාමිණී පීනප්‍රිය**